- **චරිත ස්වභාවය ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කරයි.**

ජීවත් වීමේ දී අපට විවිධ චරිත සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමට සිදු වේ. ඒ අතර මහලු චරිත, යාචක චරිත, සිහි මඳ ගති ඇති චරිත ආදී මිනිස් චරිත ද, හංස, මොනර, සිංහ ආදී සත්ත්ව චරිත ද, සුරාංගනාවන්, යක්ෂයන් ආදී මනඃකල්පිත චරිත ද වේ. මෙම චරිත නිරීක්ෂණය කිරීමේ දී එම චරිත හඳුනා ගැනීමට මුහුණේ සහ අඟ පසඟවල හැඩතල මෙන් ම ඉරියව් ද බලපාන බව පැහැදිලි වේ. චරිත එකින් එක වෙනස් වන්නේ මේවා මඟින් බව අවබෝධ කර ගත හැකි ය.

ඉහත සඳහන් කළ චරිත උපයෝගී කර ගනිමින් නර්තන නිර්මාණය කිරීමේ දී නර්තනයට අවශ්‍ය ආකාරයට අංග රචනය කර ගත යුතු ය. එසේ ම වේෂ නිරූපණයේ දී වැදගත් වන්නේ ''නළල, ඇස්,නාසය, කන් සහ අත් පා'' ය. මෙම අංග වර්ණ හා හැඩතල උපයෝගී කර ගනිමින් අවශ්‍ය ආකාරයට හැඩ ගැන්වීම ''අංග රචනය'' යනුවෙන් හැඳින්වෙයි.

අංග රචනය කිරීමේ ක්‍රම විධි

- කෙනෙකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින් ම ඉදිරිපත් කරන අංග රචනය 'ස්වාභාවික' අංග රචනය යි.
- බාහිර ස්වරූපය වෙනස් කර චරිතයට අවශ්‍ය පරිදි සකස් කර ගැනීම 'චරිතාංග' අංග රචනය යි.
- රැවුල කොණ්ඩා සැරසීම, ආදිය උපයෝගී කර ගැනීමෙන් යම් ශෛලියක් අනුව කෙරෙනුයේ ''ශෛලිගත අංග රචනය යි.
- කෝලම් ආදී චරිත නිරූපණය සඳහා විහිළු, විකාර රූපී අංග රචනය ද යොදා ගනී.

**උදාහරණ ලෙස චරිතාංග අංග රචනයක් සිදු කරන අයුරු බලමු.**

මේ අංග රචනයට පෙර අංග රචන ශිල්පියා චරිතය පිළිබඳ මනා අවබෝධයක් ලබා තිබිය යුතු යි. ඒ සඳහා ඔබ, ඔබට අවශ්‍ය කරන චරිතය ඇති ඡායාරූප, වීඩියෝ පට හොඳින් නිරීක්ෂණය කළ යුතු ය.

අපි මහලු චරිතයක් අංග රචනය කිරීම ආරම්භ කරමු. මහලු චරිතය ඉස්මතු කර දැක්වීමේ දී ප්‍රධාන තැනක් ගන්නේ එම චරිතය ඉදිරිපත් කරන්නාගේ මුහුණ ය.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

පළමු ව මුහුණ අප කොටස් කර ගත යුතු ය. (නළල, ඇස්, නාසය, කට, නිකට වශයෙන්)

- අංග රචනයට මුලින් ම භාජන කරනුයේ නළල යි. වයස්ගත ස්වභාවයේ දී ඔබගේ අධ්‍යයනය අනුව නළලේ රැලි ස්වභාවය දකින්නට ඇති අතර, නළල් තලය මත ඇති එම රැලි වැඩි ප්‍රමාණයක් ඇඳ එය හිස දක්වා විහිදෙන බවක් පෙන් විය හැකි ය.
- වයස්ගත චරිතයක ඇස් නිර්මාණය කිරීමේ දී පීඩාකාරී බව, විඩාවට පත් බව ඇස් යට ගිය ආකාරය පෙන්විය යුතු ය. ඒ සඳහා ඇස් වටා අඳුරු කරනු ලබයි.
- වයස් ගත පුද්ගලයකුගේ නාසය නිර්මාණය කිරීමේ දී මුහුණට ගැළපෙන ආකාරයට නාසය මතුපිටින් හැඩ (ත්‍රිමාණ/ද්විමාන) ඇඳ ගැනීමට පුළුවන.

- කට නිරූපණය කිරීමේ දී වයස් ගත වන විට දෙතොල සිහින් හැඩයක් ගන්නා බැවින් එය පෙන්විය යුතු ය. සිහින් වන විට දුර්වර්ණ ස්වභාවයක් දිස් වේ. මුඛයේ දත් ද වයස අනුව වර්ණ ගැන්විය යුතු ය. මේ සඳහා කළු වර්ණය භාවිත කිරීමෙන් කටෙහි දත් නැති බව පෙන්විය හැකි ය.

**කම්මුල්**

වයස් ගත වන විට කම්මුල් වල ගැසුණු ස්වරූපයක් ගනී. අඳුරු වර්ණ යොදමින් චරිතයට අනුකූල ව එය නිර්මාණය කළ හැකි ය.

**නිකට**

වයස් ගත පුද්ගලයන්ගේ නිකට පහතට එල්ලා වැටෙන ස්වභාවයක් දැකිය හැකි ය.

මේ ආකාරයට අංග රචනය කිරීමේ දී පහත සඳහන් ද්‍රව්‍ය භාවිත කළ හැකි ය.

- මූලික ආලේපන (Base make up - Pan Cake)
  (මෙය ස්පොන්ච් කැල්ලක් තෙමා ආලේප කළ හැකි ය.)

- රේඛා ඇඳීම (Lining Colours)
  (අංග රචනයේ දී විවිධ හැඩ, රූප, වර්ණ මතු කිරීම සඳහා භාවිත කරයි.)

- ආලේපන පැන්සල් (Make up pencils)
  රේඛා ඇඳීමටත්, හැඩ තල මතු කිරීමටත් භාවිත කළ හැකි ය.

- බුරුසු හා ස්පොන්ච් භාවිතය (Brushes & Sponges)
  වර්ණ ආලේප කිරීමට සහ බේස් පවුඩර් ආලේප කිරීම සඳහා භාවිත කරයි.

- පවුඩර් භාවිතය (Powder/Powder Puff)
  මේවා යොදා ගනු ලබන්නේ 'මේක් අප් ' කිරීමෙන් පසු සුළු වශයෙනි. මෙ මගින් දහඩිය දැමීමෙන් මුහුණේ ඇති වන දිලිසෙන ස්වභාවය නැති කර ගත හැකි ය.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

- දත් වර්ණය (Tooth Enamels)
  දත් වර්ණ කිරීම සඳහා භාවිත කරයි.

- Removing Cream
  මුහුණේ මේක් අප් ඉවත් කිරීම සිදු කරයි.

- මීට අමතර ව
  Rooch
  Eye shadows
  Lipstick
  Eye Lasheres

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)